කාර්යාලය / அலுவலகம் / Office: 011-2186055

මගේ අංකය. / எனது இல. / My No. MWCA/2/5/4/4/2/5

කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය

மகளிர்,சிறுவர் அலுவல்கள்மற்றும் உலர்வலய அபிவிருத்திஅமைச்சு

Ministryof Women &Child Affairs and Dry Zone Development

ලේකම් / செயலாளர் / Secretary: 011-2186057

ඔබේ අංකය. / உமது இல. / Your No.

ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2187249

ඊමේල්/மின் தபால் / Email: secycdwa@gmail.com

වෙබ් අඩවිය/,izaj;jsk; / Website:www.childwomenmin.gov.lk

දිනය. / திகதி. / Date 2019.01.24

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයේ මූල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවීම - 2020 .

ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 03/2017 ට අනුව කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව දැනට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම්-2020 සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. සියළුම අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව ( ඇමුණුම් 01) සකස් කර ඔබගේ නිර්දේශ සමග 2019.02.15 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත එවීමට සැලැස්විය යුතු අතර, එදිනෙන් පසු ලැබෙන කිසිදු අයදුම්පතක් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

03. ස්ථාන මාරුවීමට අපේක්ෂාවෙන් සිටින සහ මින් පෙර කිසිදු ස්ථාන මාරුවීමක් ලබා නොමැති නිලධාරීන් සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දෙන අතර ඉතා ප්‍රියමනාප, ප්‍රියමනාප, ප්‍රියමනාප නොවන සේවා ස්ථාන ස්ථිර පදිංචිය තිබූ /ඇති ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර ප්‍රමාණය පදනම් කරගෙන වර්ගීකරණය කරනු ලබයි.

I ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන :-

ස්ථිර පදිංචිය තිබූ/ඇති ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර කි.මී 25 ට අඩු නම් එම සේවා ස්ථාන ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක් වේ .

II ප්‍රියමනාප සේවා ස්ථාන :-

ස්ථිර පදිංචිය තිබූ/ඇති ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර කි.මී 25-50 අතර නම් එම සේවා ස්ථානය ප්‍රියමනාප සේවා ස්ථානයක් වේ .

III ප්‍රියමනාප නොවන සේවා ස්ථාන :-

ස්ථිර පදිංචිය තිබූ/ඇති ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර කි.මී 50 ට වැඩි නම් එම සේවා ස්ථානය ප්‍රියමනාප නොවන සේවා ස්ථාන වේ .

04. සියළුම ස්ථාන මාරුවීම් අයදුම් පත් 2019. 02.15 දිනට පෙර ලැබීමට සලස්වන මෙන් දන්වන අතර අදාල නිලධාරින්ගේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී එහි සඳහන් කරුණු නිවැරදිද යන්න පිළිබඳව හොඳින් පරීක්ෂා කර බලා අදාල තොරතුරු පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බවට තහවුරු කර ඔබගේ නිර්දේශය සමග ඉදිරිපත් කිරීම මැනවි.

05. අවශ්‍ය නිලධාරීන් ගණන ඉක්මවා කිසිදු හේතුවක් මත ස්ථාන මාරුවීම් ලබා නොදෙන බව ද, අතිරික්ත වන සේ නිලධාරීන් මාරු කිරීමෙන් අමාත්‍යාංශයේ කටයුතුවලට බාධාවක් පැමිණෙන බැවින් එවැනි මාරුවීම් සිදු කරනු නොලබන බව ද කාරුණිකව දන්වමි.

06. ස්ථාන මාරුවීම් ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට මෙම අමාත්‍යාංශය මගින් ඔබ දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති අයත් සංවර්ධන නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි. මෙම තොරතුරු අමාත්‍යාංශ වෙබ් අඩවියේද www.childwomenmin.gov.lk ඇතුලත් කර ඇත.

ඩී.එස්.විජේසේකර

අතිරේක ලේකම් (පාලන)

ලේකම් වෙනුවට